# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1702/3 - 2011 අප්‍රේල් 19 වැනි අඟහරුවාදා - 2011.04.19

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

### මුදල් නීති පනත

2002 අංක 32 දරන මුදල් නීති (සංශෝධන) පනතින් සංශෝධිත මුදල් නීති පනතේ (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වැනි අධිකාරය) 10 (ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,  
අධිපති,  
ශ්‍රී ලංකා මහ බැංකුව.

2011 අප්‍රේල් මස 19 වැනි දින.  
කොළඹ 01,

"ඇ" රෙගුලාසිය

**සංචිත අවශ්‍යතා**

මුදල් මණ්ඩලය විසින් පනවන ලද හා 2003 මාර්තු 20 වැනි දින අංක 1280/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2008 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 1571/12, 2008 නොවැම්බර් මස 26 වැනි දින අංක 1577/7 සහ 2009 පෙබරවාරි මස 26 වැනි දින අංක 1590/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රවල* පළ කරන ලද දැන්වීම් මගින් සංශෝධිත "ඇ" රෙගුලාසිය 2011 අප්‍රේල් මස 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

අංක 2 (i) රෙගුලාසියෙහි "7.00" ඉලක්කම ඉවත් කර ඒ වෙනුවට "8.00" ඉලක්කම ආදේශ කිරීමෙන්.

05-50


1A - G 14418—350 (2011/04)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.